සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2019
# පුරවැසි අධ්‍යාපනය - I

10 ශ්‍රේණිය | කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. රටක තීන්දු ගැනීමේ ක්‍රියාවලියට ජනතාව කෙළින්ම පාලනයට සම්බන්ධ වීම හඳුන්වනු ලබන්නේ කුමන නමකින්දැයි පිළිතුරු අතරින් තෝරන්න.
(1) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය (2) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය
(3) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය (4) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය

02. සප්ත අපරිහාණීය ධර්ම අනුගමනය කළ වජ්ජි ජනපදයේ පැවති පාලන ක්‍රමය හැඳින්වූයේ කුමන නමකින්දැයි පිළිතුරු අතරින් තෝරන්න.
(1) රදළ ආණ්ඩු (2) සමූහාණ්ඩු
(3) රාජාණ්ඩු (4) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු

03. සමාජ හා ජීවන ක්‍රමයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදයේ ඇති වැදගත්කම දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) එය මහජන කැමැත්ත මත සිදුවන නිසාය.
(2) ආණ්ඩු බලය හිමිවන්නේ බහුතර බලයක් ලබාගත් පක්ෂයට ය.
(3) නීති සම්පාදනය කරන්නේ මහජන ඡන්දයෙන් තේරී පත්වූ නියෝජිතයන්ගේ බහුතර කැමැත්ත අනුවය.
(4) ප්‍රජාතන්ත්‍රවාදය අයිතිවාසිකම් බුක්ති විඳිමින් යුතුකම් අගයන නිසාය.

04. උතුරු පළාතට අයත් මැතිවරණ දිස්ත්‍රික්ක දෙක පිළිතුරු අතරින් තෝරන්න.
(1) යාපනය හා වන්නිය (2) යාපනය හා ත්‍රිකුණාමලය
(3) යාපනය හා කිලිනොච්චිය (4) යාපනය හා මන්නාරම

05. ඡන්දදායකයකු සතු අයිතිවාසිකමක් වන්නේ කුමක් ද? පිළිතුරු අතරින් තෝරන්න.
(1) අන් අයගේ ඡන්ද අයිතිය සුරැකීම. (2) තම ඡන්දය පාවිච්චි කිරීම.
(3) මැතිවරණ රාජකාරිවලට බාධා නොකිරීම. (4) මැතිවරණ නීති රීතිවලට අවනත වීම.

06. ''ජනතාවගේ දුක්ගැනවිලි පාලක පක්ෂයේ අවධානයට යොමුකිරීම'' කුමන ආයතනයක කාර්ය භාරයක් ද? පිළිතුරු අතරින් තෝරන්න.
(1) නිදහස් ජනමාධ්‍යවල කාර්යයකි. (2) ආණ්ඩු පක්ෂයේ කාර්යයකි.
(3) විරුද්ධ පක්ෂයේ කාර්යයකි. (4) සිවිල් සංවිධානවල කාර්යයකි.

• **පහත දක්වා ඇති වගන්ති කියවා 07 හා 08 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ D විද්‍යාත්මක දැනුම වර්ධනය
B යුධ හා නාවික ශක්තිය E ජාතික ඒකාග්‍රතාවය
C පුනරුදය F දියුණු ආර්ථික තත්ත්වය

07. ඉහත වගන්ති වලින් යුරෝපයේ ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු අඩංගු පිළිතුර වන්නේ,
(1) ABC (2) CDE (3) ACD (4) DEF

08. ඉහත වගන්ති වලින් යුරෝපයේ සමහර රටවල් ප්‍රබල ජාතික රාජ්‍ය බවට පත්වීමට හේතු වූ කරුණු ඇතුළත් පිළිතුර වන්නේ,
(1) ABC (2) CDE (3) DEF (4) BEF

09. අධිකරණයේ ප්‍රධාන කාර්යය කුමක්දැයි පිළිතුරු අතරින් තෝරන්න.
(1) විධායකය පාලනය කිරීම. (2) රාජ්‍ය සේවය පාලනය කිරීම.
(3) පුරවැසි අයිතිවාසිකම් සුරැකීම. (4) නීති සම්මත කිරීම.

10. ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරීපත්වීම කුමන ආණ්ඩුක්‍රමයක ලක්ෂණයක් ද?

(1) ජනාධිපති ආණ්ඩුක්‍රමයක ලක්‍ෂණයකි. (2) මිශ්‍ර ආණ්ඩුක්‍රමයක ලක්‍ෂණයකි.

(3) කැබිනට් ආණ්ඩුක්‍රමයක ලක්‍ෂණයකි. (4) ඒකාධිපති ආණ්ඩුක්‍රමයක ලක්‍ෂණයකි.

11. මනා දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් කිසියම් රටක සිටීම නිසා අත්වන ප්‍රයෝජන ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) තමන් කැමති පාලකයන් ජනතාවට පත්කර ගැනීමට ඉඩ ලැබීම.

(2) ප්‍රදේශයේ ඉතා ජනප්‍රිය පුද්ගලයන් ව්‍යවස්ථාදායකකයට පත්කර යැවීමට හැකිවීම.

(3) අවංක ආදර්ශවත් අපේක්ෂකයන් පත්කර යැවීමට ජනතාවට අවස්ථාව ලැබීම.

(4) තමන් වඩාත් ආදරය කරන දේශපාලන පවුලකට අයත් පුද්ගලයකු පත්කර ගැනිමට අවස්ථාව ලැබීම.

12. මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය පාලන ඒකක වෙත ලබාදීම හඳුන්වනු ලබන්නේ,

(1) බලය බෙදීම යනුවෙනි. (2) බලය විමධ්‍යගත කිරීම යනුවෙනි.

(3) බලය විතැන් කිරීම යනුවෙනි. (4) බලය පැවරීම යනුවෙනි.

13. සෑම ආකාරයකම අධිකාරී බලය එක් මධ්‍යම ආයතනයක් තුළ ඒකරාශීවී තිබේනම් එවැනි ආණ්ඩුක්‍රමයක් ඔබ හඳුනාගෙන ඇත්තේ කුමන නමකින් ද?

(1) සන්ධීය ආණ්ඩු (2) ඒකීය ආණ්ඩු (3) සහසන්ධීය ආණ්ඩු (4) අර්ධ සන්ධීය ආණ්ඩු

14. සන්ධීය රාජ්‍යයක සියලුම ජන කොටස් පොදු හැඟීමෙන් යුතුව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ. එය හඳුන්වනු ලබන්නේ,

(1) සන්ධීය රාජ්‍යයක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංගයක් ලෙසය.

(2) සන්ධීය රාජ්‍යයක පවතින ලක්ෂණයක් ලෙසය.

(3) සන්ධීය රාජ්‍යයක නව ප්‍රවණතාවයක් ලෙසය.

(4) සන්ධීය රාජ්‍යයක බලය බෙදීමේදි අවශ්‍යයෙන්ම තිබිය යුතු අංගයක් ලෙසය.

15. ඒකීය රාජ්‍යයකට හා සන්ධීය රාජ්‍යයකට පිළිවෙලින් උදාහරණ දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) ශ්‍රී ලංකාව හා මහා බ්‍රිතාන්‍යයයි. (2) ශ්‍රී ලංකාව හා ඇමරිකා එක්සත් ජනපදයයි.

(3) මහා බ්‍රිතාන්‍ය හා ප්‍රංශයයි. (4) ශ්‍රී ලංකාව හා ප්‍රංශයයි.

16. පළාත් සභාවක මහ ඇමතිවරයා පත්කරනු ලබන්නේ කවරකු විසින්දැයි පිළිතුරු අතරින් තෝරන්න.

(1) පළාත් සභාවේ බහුතර විශ්වාසය දිනාගන්නා පුද්ගලයා ජනාධිපති විසිනි.

(2) පළාත් සභාවේ මන්ත්‍රීවරු විසිනි.

(3) අගමැති විසිනි.

(4) පළාත් සභාවේ බහුතර විශ්වාසය දිනාගන්නා තැනැත්තා ආණ්ඩුකරු විසිනි.

17. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පොළොන්නරුවේ මහා පරාක්‍රමබාහු රජු විසින් ''ගම්භාර'', ''ගාමිණී'' වැනි නිලධාරීන් පත්කිරීම.

(2) 1948 ගම් සභා ක්‍රමය නැවත ඇතිකිරිම.

(3) ක්‍රි.ව. 1865 මුල්ම මහනගර සභා දෙක ලෙස කොළඹ හා යාපනය පිහිටුවීම.

(4) 1987 අංක 15 දරන පනත මගින් ප්‍රාදේශීය සභා ඇති කිරීම.

18. ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත අතර ඇතිවන ගැටුම් නිරාකරණය කරනු ලබන්නේ කවුරුන් විසින්දැයි පිළිතුරු අතරින් තෝරන්න.

(1) ආණ්ඩුකරු විසිනි. (2) ජනාධිපති විසිනි.

(3) අග්‍රවිනිශ්වයකරු විසිනි. (4) ශ්‍රේෂ්ඨාධිකරණය විසිනි.

19. ස්විස්ටර්ලන්තය සන්ධීය රාජ්‍යයක් බවට පත්වීමට හේතු වූ කරුණ පිළිතුරු අතරින් තෝරන්න.

(1) දැඩි භුගෝලීය විෂමතාවය නිසා ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීමට අපහසුවීම.

(2) ඉතා විශාල රාජ්‍යයක් නිසා පාලනය කිරීමට අපහසුවීම.

(3) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් ආරක්ෂාවීම සඳහාය.

(4) දැඩි සංස්කෘතික විවිධත්වයක් නොමැතිවීම නිසාය.

20. පහත ''අ'' තීරුව ''ආ'' තීරුව සමග නිවැරදිව ගළපන ලද පිළිතුර තෝරන්න.

| ''අ'' | | ''ආ'' |
|---|---|---|
| 1. පළාත් සභාවට හිමි බලතලයකි. | A | ආරක්ෂාව හා විදේශ කටයුතු |
| 2. මධ්‍යම ආණ්ඩුවට හිමි බලතලයකි. | B | පළාත් පාලන කටයුතු |
| 3. ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකයයි. | C | කැන්ටන් |
| 4. ස්විස්ටර්ලන්තයේ ප්‍රාන්ත රාජ්‍ය හඳුන්වන නමයි. | D | කොංග්‍රසය |

(1) ABCD (2) BADC (3) BCDA (4) BACD

21. මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය මූලික දේවල් හඳුන්වනු ලබන්නේ කුමන නමකින්ද? පිළිතුරු අතරින් තෝරන්න.
(1) මූලික සම්පත් ලෙසයි. (2) වුවමනා ලෙසයි.
(3) අවශ්‍යතා ලෙසයි. (4) විවිධ අවශ්‍යතා ලෙසයි.

- **පහත දැක්වෙන තොරතුරු ඇසුරින් 22 හා 23 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A බණිජ තෙල් නිෂ්පාදනය
B රෝහල් සේවාව
C පාසල් පවත්වාගෙන යාම
D දුම්රිය සේවාව
E අධිවේගී මාර්ග ඉදිකිරීම
F මංමාවත් ඉදිකිරීම

22. ඉහත තොරතුරු වලින් රාජ්‍ය අංශය පමණක් නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවාවලට අයත් පිළිතුර වන්නේ,
(1) ABC (2) DEF (3) BCD (4) ADE

23. ඉහත තොරතුරු වලින් රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයම නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවාවලට අයත් පිළිතුර වන්නේ,
(1) BEC (2) BCD (3) BCF (4) BEF

24. නිෂ්පාදන සාධක හා ඒවාට කරන ගෙවීම් අනුව ගැළපෙන පිළිතුරු යුගලය තෝරන්න.
(1) භූමිය - ශ්‍රමය (2) ව්‍යවසායකත්වය - පොළිය
(3) ප්‍රාග්ධනය - ලාභය (4) ශ්‍රමය - වැටුප

25. පහත සඳහන් භාණ්ඩවලින් ආර්ථික නොවන භාණ්ඩ ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) හිරුඑළිය, වාතය, ජලය (2) හිරුඑළිය, බෝතල් කළ පානීය ජලය, වාතය
(3) හිරුඑළිය. ජලවිදුලිය. ගංගා වැලි (4) සූර්ය බලය, ජලවිදුලිය. ඔක්සිජන් වාතය

26. ධනවාදී අර්ථ ක්‍රමයක දැකිය හැකි ලක්ෂණ පහත පිළිතුරු අතරින් තෝරන්න.
(1) දේපළ අයිතිය රජය සතුවීම.
(2) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේදී පොදු යහපත උදෙසා කටයුතු කිරීම.
(3) ලාභය අරමුණු කරගෙන නිෂ්පාදනය සිදුවීම.
(4) ආර්ථිකය මෙහෙයවීම මධ්‍යගත සැළසුම් මණ්ඩලයක් මගින් සිදුකිරීම.

27. 1977 ට පෙර ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ දක්නට ලැබුණු ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම. (2) ආනයන අපනයන සීමා ලිහිල් කිරීම.
(3) ආවෘත නැඹුරු ආර්ථිකයක් ක්‍රියාත්මක වීම. (4) විදේශ ආයෝජකයන්ට බදු සහන ලබාදීම.

28. පරිවර්තන ආර්ථිකයක දැකිය හැකි ලක්ෂණයක් ඇති පිළිතුර තෝරන්න.
(1) සහනාධාර හා මිල පාලන ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
(2) පාලන නීතිරීති සීමා වැඩිකිරීම.
(3) පෞද්ගලික ව්‍යවසායකයන් දිරිගැන්වීම.
(4) පාලන විනිමය අනුපාතිකයක් හඳුන්වාදීම.

29. 1977 න් පසු ක්‍රියාත්මක වූ ආර්ථික ප්‍රතිපත්ති යටතේ පෞද්ගලික ව්‍යවසායකයන් දිරිගැන්වීම සඳහා හඳුන්වා දුන් ප්‍රතිපත්ති ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) වෙළඳ බාධා (තීරු බදු) වැඩිකිරීම.
(2) වෙළඳපලට රජයේ මැදිහත්වීම වැඩිකිරීම.
(3) රාජ්‍ය දේපල පෞද්ගලිකරණය කිරීම.
(4) ආවෘත වෙළඳපල ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.

30. ගෝලීයකරණය පිළිබඳ වඩාත් නිවැරදි අර්ථ කථනය පිළිතුරු අතරින් තෝරන්න.
(1) වැඩ ලෝකය පුළුල් විම ගෝලීයකරණයයි.
(2) ලෝකයේ ඕනෑම රටක ජීවත්විය හැකි වීමයි.
(3) ලෝක ආර්ථිකය එකම ආර්ථිකයක් බවට පත්වීමයි.
(4) තාක්ෂණයත් සමග ලෝකය සමීප වීමයි.

31. දකුණු ආසියාතික වරණාත්මක වෙළඳ ගිවිසුම (SAPTA) අත්සන් කර ඇති රටවල් දෙක වන්නේ,
(1) ඉන්දියාව හා ශ්‍රී ලංකාවයි. (2) ඇමරිකාව හා කැනඩාවයි.
(3) බංගලාදේශය හා මියැන්මාරයයි. (4) ප්‍රංශය හා බ්‍රිතාන්‍යයයි.

32. ගැටුමට ලක්වී ඇති පුද්ගල පාර්ශවයන්ගේ අදහස්ද සැලකිල්ලට ගනිමින් ගැටුම් නිරාකරණය කිරීම හඳුන්වනු ලබන්නේ,
(1) සංවේදි ගැටුම් නිරාකරණ ක්‍රමයයි.
(2) ප්‍රජාතන්ත්‍රවාදි ආකාරයෙන් ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමයයි.
(3) වෘත්තීය මැදිහත්කරුවන් මගින් ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමයයි.
(4) මනා සන්නිවේදනයන් ඇතිකර ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමයයි.

33. ගැටුම් නිරාකරණය සඳහා යොදාගන්නා ''සාකච්ඡා කිරීමේ ක්‍රමය'' අවසන් විය යුත්තේ කෙසේදැයි පිළිතුරු අතරින් තෝරන්න.
(1) සාකච්ඡාවෙන් පසු විසඳුම් කරා ඒම තුළින් ය.
(2) දෙපාර්ශවයටම ජය ජය විසඳුම් ලැබීම තුළින් ය.
(3) ගැටුමට මුල්වූ කණ්ඩායමට එහි අහිතකර බව වටහාදීම තුළින් ය.
(4) අසාධාරණයට ලක්වූ කණ්ඩායමට ජය ලබාදීම තුළින් ය.

34. සේව්‍ය හා සේවක දෙපාර්ශවය අතර ඇතිවන වෘත්තීය ගැටලු විසඳීම සඳහා යොදාගනු ලබන ගැටුම් නිරාකරණ ක්‍රමය පිළිතුරු අතරින් තෝරන්න.
(1) සහ සම්මන්ත්‍රණය හා කේවල් කිරීම (2) මැදහත්කරණය
(3) බේරුම්කරණය (4) සමථකරණය

35. ගැටුම් ඇතිවන සමාජයක් තුළ මිනිසාගේ මනසේ සාමය ඇතිකර ගැනීම සඳහා කළ හැකි ක්‍රියාකාරකමක් පිළිතුරු අතරින් තෝරන්න.
(1) මනෝ විද්‍යාත්මක අභ්‍යාසවල යෙදීම. (2) වේග රිද්ම සංගීතයට සවන්දීම.
(3) ප්‍රචණ්ඩ වචන භාවිත කිරීම. (4) කලහකාරි ලෙස හැසිරීම.

36. මැදිහත්කරුවකු තුළ තිබිය යුතු ගුණාංගයක් වන්නේ කුමක්දැයි පහත පිළිතුරුවලින් තෝරන්න.
(1) තමාගේ තීන්දු විසඳුම් දෙපාර්ශවය මත පටවන්නකු විය යුතුය.
(2) දෙපාර්ශවයටම හොඳින් බලපෑම් එල්ල කළ හැකි අයකු විය යුතුය.
(3) ගැටුම් පිළිබඳ පූර්ණ අවබෝධයක් ඇති අයකු විය යුතුය.
(4) දෙපාර්ශවයම නම්‍යශීලී විසඳුම් කරා ගෙනයා හැකි පක්ෂපාතී පුද්ගලයකු විය යුතුය.

37. ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ කවරකු විසින්දැයි පිළිතුරු අතරින් තෝරන්න.
(1) චාර්ල්ස් ඒ. එල්වුඩ් ය. (2) ජොහාන් ගැල්ටුං ය.
(3) ඊටි හිලර් ය. (4) ටී. බී. ටයිලර් ය.

38. බහු සංස්කෘතික ජන සමාජයක් තුළ දැකිය **නොහැකි** ලක්ෂණයක් වන්නේ කුමක්දැයි පහත පිළිතුරු වලින් තෝරන්න.
(1) විවිධ සංස්කෘතීන් තිබුණත් සමාජය ගැටුම් නොමැති ඉතා සාමකාමී එකක් වීම.
(2) විවිධ ජනවර්ග, විවිධ භාෂා කථාකරන පුද්ගලයන් එකට සිටීම.
(3) එක ජන කොටසක වුවද ප්‍රාදේශීය විවිධත්වයන් තිබීම.
(4) විවිධ සංස්කෘතීන්ට අයත් විවිධ සිරිත් විරිත් හා ඇගයීම් පද්ධති පැවතීම.

39. රටක යහපාලනය බිඳවැටීමට හේතුවක් වන්නේ,
(1) රාජ්‍ය පාලකයන් වගකීමෙන් යුතුව කටයුතු කිරීමයි.
(2) අල්ලස හා දූෂණය පහළ යාමයි.
(3) නිලධාරීන් අවංක වීමයි.
(4) රාජ්‍ය සේවය දේශපාලනීකරණය විමයි.

40. පහත ''අ'' තීරුව සමග ''ආ'' තීරුව නිවැරදි ලෙස ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| ''අ'' | | ''ආ'' | |
|---|---|---|---|
| 1. | උපදේශනය | A | ගැටුමකට මැදිවී සිටින පාර්ශවකරුවන්ගේ කැමැත්ත මත නිරාකරණයට තුන්වන පාර්ශවයක් මැදිහත්වීම. |
| 2. | විනිසීම | B | ගැටුම් විසඳීම සම්බන්ධයෙන් අධිකරණයේ පිහිට පැතීම හා සම්බන්ධ වේ. |
| 3. | බේරුම්කිරීම | C | ගැටුම් පාර්ශවවලට තෙවන පාර්ශවයක් විසින් උපදෙස් හා මගපෙන්වීම ලබා දෙමින් ගැටුම් නිරාකරණයට යොමුවේ. |
| 4. | සමථකරණය | D | ගැටුමක් හෝ මතභේදයක් විසඳීම සඳහා යොමුකරවන මැදිහත්වීමකි. මෙය අවසන් විසඳුම නොවේ. සමථකරු පුද්ගලයකු හෝ කණ්ඩායමක් විය හැකිය. |

(1) CBAD (2) ABDC (3) DABC (4) CABD

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**10 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය - II**

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක්ද සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) (i) ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යවල ලක්ෂණ 2 ක් ලියන්න.

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ලක්ෂණ 2 ක් නම් කරන්න.

(iii) රාජ්‍ය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ චින්තකයන් දෙදෙනෙකු නම් කරන්න.

(iv) ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු 2 ක් ලියන්න.

(v) ආණ්ඩුවක ප්‍රධාන ආයතන 2 ක් නම් කරන්න.

(vi) බලයේ පවතින විවිධ ස්වරූප 2 ක් ලියන්න.

(vii) ශ්‍රී ලංකාව තුළ දක්නට ඇති ප්‍රධාන සංස්කෘතීන් 2 ක් සඳහන් කරන්න.

(viii) යහපාලනය ක්‍රියාත්මක වන රටක දේශපාලනය තුළ දැකිය හැකි විශේෂතා 2 ක් ලියන්න.

(ix) නිෂ්පාදනය සඳහා යොදාගන්නා ප්‍රධාන ශිල්ප ක්‍රම 2 ක නම් කරන්න.

(x) ලෝක මට්ටමෙන් සිදුවූ අන්තර්ජාතික ගැටුම්වලට උදාහරණ දෙකක් ලියන්න.

02 පොදු සමාජ යහපත උදෙසා මිනිසුන් එකට එකතුවී සදාගත් උත්තරීතරම සංවිධානය වන්නේ රාජ්‍යයයි.

(i) රාජ්‍යයක අත්‍යාවශ්‍ය අංග ලක්ෂණ 2 ක් නම් කරන්න.

(ii) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ 3 ක් ලියන්න.

(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වය සඳහා බලපාන ප්‍රධාන සාධක 3 ක් ලියා එකක් කෙටියෙන් විස්තර කරන්න.

03 ඒකීය රාජ්‍යයන් බලය විමධ්‍යගත කිරීම මගිනුත්, සන්ධීය රාජ්‍ය බලය බෙදීම මගිනුත් ආණ්ඩුව සිය ප්‍රාදේශීය පාලන ඒකකවලට බලය ලබාදෙයි.

(i) නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු 2 ක් ලියන්න.

(ii) ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමට ඇතිකළ පළාත් සභාවල බලය බෙදා ඇති ලැයිස්තු 3 ක් දක්වන්න.

(iii) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුන දක්වා එකක් පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න.

04 ඕනෑම පුද්ගලයකු උපතේ සිට මරණය දක්වාම හැසිරෙන්නේ එකිනෙකාට උරුම වූ සංස්කෘතියකට අනුව ය.

(i) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති විවිධ සාධක අතුරින් 2 ක් නම් කරන්න.

(ii) බහු සංස්කෘතික ජන සමාජයක යහ පාලනය ක්‍රියාත්මක වීමෙන් ලැබෙන වාසි තුනක් ලියන්න.

(iii) බහු සංස්කෘතික ජන සමාජයක එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ 3 ක් ලියා එකක් කෙටියෙන් විස්තර කරන්න.

05 මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීමට යාමේදී ඕනෑම අර්ථ ක්‍රමයකට විවිධ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවෙයි.

(i) ඕනෑම ආර්ථිකයක් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න 2 ක් ලියන්න.

(ii) ආර්ථිකයක් නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකිය. එම ආකාර තුන ලියා දක්වන්න.

(iii) ඕනෑම ආර්ථිකයක සිදුවන ආර්ථික ක්‍රියාවලින් ප්‍රධාන කොටස් තුනකි. ඒවා නම්කර ඉන් එකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

06 වෙළඳපල ආර්ථිකයක දැකිය හැකි මූලික ලක්‍ෂණයක් වන්නේ වෙළඳපලට රජයේ මැදිහත්වීම අවම වීමයි.

(i) නව ලිබරල්වාදී වෙළඳපල ආර්ථිකයක මූලික ලක්‍ෂණ 2 ක් නම් කරන්න.

(ii) වෙළඳපල ආර්ථිකයන්හි ප්‍රධාන ස්වරූප 3 ලියන්න.

(iii) මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට යාමේදී අපට හමුවන අර්ථ ක්‍රම 3 ලියා එකක් කෙටියෙන් විස්තර කරන්න.

07 ගැටුම් සෑම සමාජයකම දැකිය හැකිය. එය විවිධත්වයේ ප්‍රතිඵලයකි.

(i) අන්තර්ජාතික ගැටුම්වල ප්‍රධාන කොටස් 2 නම් කරන්න.

(ii) ඕනෑම රටක ගැටුම් ඇතිවීමේ මූල 3 ක් ලියන්න.

(iii) ගැටුමක් සාමකාමීව විසඳා ගැනීමෙන් ඇතිවන වාසි 3 ක් ලියා එකක් විස්තර කරන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(2) | 3 -(4) | 4 -(1) | 5 -(2) | 6 -(1) | 7 -(3) | 8 -(4) | 9 -(3) | 10 -(3) |
| 11-(3) | 12-(1) | 13-(2) | 14-(1) | 15-(2) | 16-(4) | 17-(4) | 18-(4) | 19-(1) | 20-(2) |
| 21-(3) | 22-(4) | 23-(3) | 24-(4) | 25-(1) | 26-(3) | 27-(3) | 28-(3) | 29-(3) | 30-(4) |
| 31-(1) | 32-(2) | 33-(2) | 34-(1) | 35-(1) | 36-(3) | 37-(2) | 38-(1) | 39-(4) | 40-(1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) * පාලනය ඍජු ප්‍රජාතන්ත්‍රවාදය පදනම් කර ගැනීම.
* ප්‍රධාන පාලන ඒකක පුරවැසි සභා වීම.
* පාලනයට පුරවැසියන් පමණක් සම්බන්ධ වීම.

(ii) * සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන පාලකයන් තෝරාගැනීම.
* තරඟකාරී පක්ෂ ක්‍රමය
* ඡන්ද කොට්ඨාස ක්‍රමය
* නිදහස් හා සාධාරණ මැතිවරණ... ආදී වශයෙන්

(iii) මහාචාර්ය ගානර් හා ඇරිස්ටෝටල්

(iv) * රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ
* පුනරුදය
* වැඩවසම්වාදය බිඳවැටීම
* විද්‍යාත්මක දැනුම වර්ධනය

(v) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය

(vi) ආර්ථික බලය, දේශපාලන බලය, සමාජ බලය

(vii) සිංහල බෞද්ධ / දෙමළ හින්දු / මුස්ලිම් ඉස්ලාම් / ක්‍රිස්තියානි

(viii) * එකිනෙකාගේ දේශපාලන අනන්‍යතාවයට ගරු කිරීම.
* තමන් කැමති දේශපාලන මතවාදයන් දැරීම.
* දේශපාලන නායකත්වයට ගරු කිරීම.
* නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම.

(ix) 1. ශ්‍රම සූක්ෂම 2. ප්‍රාග්ධන සූක්ෂම

(x) 1. I ලෝක යුද්ධය 2. II ලෝක යුද්ධය

02 (i) භූමිය / ජනගහනය / ආණ්ඩුව / ස්වාධිපති බලය

(ii) * එක් ජාතියක් එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීම.
* භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය යන අංගවලින් සමන්විත වීම.
* වෘත්තීය නිල බල පැලැන්තියක් මගින් පාලන බලය මෙහෙයවීම.
* අභ්‍යන්තර හා බාහිර කටයුතු සම්බන්ධයෙන් ස්වාධිපති බලය හිමිවීම.

(iii) * නිදහස් හා සාධාරණ මැතිවරණ
* නීතියේ ආධිපත්‍ය
* අධිකරණයේ ස්වාධීනත්වය
* දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් සිටීම
* යහපත් ආර්ථිකයක් තිබීම
* අපක්ෂපාති ජනමාධ්‍ය තිබීම
* ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්ම

03 (i) * විවිධත්වය තුළ එක්සත්කම ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවය
* රාජ්‍ය විශාලවීම, එක් මධ්‍යස්ථානයක සිට පාලනය අපහසුවීම.
* ජාතික ආරක්ෂාව තහවුරු කිරීම.

(ii) 1. පළාත් සභා ලැයිස්තුව 2. සමගාමී ලැයිස්තුව 3. සංචෘත ලැයිස්තුව

(iii) මහනගර සභා / නගර සභා / ප්‍රාදේශීය සභා

04 (i) පිහිටීම / සංක්‍රමණය / ආක්‍රමණ / වෙළඳාම සඳහා පැමිණීම / ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම

(ii) * ජනවර්ග අතර විශ්වාසය තහවුරු වීම.
* එකිනෙකා අතර අවබෝධය පුළුල් වීම.
* එකිනෙකාට ගරු කිරීම.
* විනිවිධ භාවයෙන් කටයුතු කිරීම (පි. 65)

(iii) * ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වීම.
* ගැටුම් අවම වීම.
* සුහදත්වය වර්ධනයවීම.
* අන්‍ය ජාතීන්ට හෝ ආගම්වලට අගරු නොවන ආකාරයට හැසිරීම (පි. 67)

05 (i) * කුමක් කොපමන නිෂ්පාදනය කරන්නේ ද?
* කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?
* කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද?

(ii) පාරිභෝගික භාණ්ඩ / අන්තර් භාණ්ඩ / ප්‍රාග්ධන භාණ්ඩ

(iii) නිෂ්පාදනය / බෙදාහැරීම / පරිභෝජනය

06 (i) * රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය කිරීම.
* වෙළඳපල තත්ත්වය මත මිල තීරණය වීම.
* දේශීය, විදේශීය පෞද්ගලික ආයෝජකයන් දිරිගැන්වීම (පි. 78)

(ii) * ධනවාදී වෙළඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන වෙළඳපොළ
* සමාජවාදී ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන වෙළඳපොළ
* පරිවර්තන ආර්ථික හෙවත් වෙළඳපොළ ආර්ථිකයක් කරා ගමන් කරමින් සිටින රටවල වෙළඳපොළ

(iii) * ධනවාදී අර්ථ ක්‍රමය
* සමාජවාදී අර්ථ ක්‍රමය
* මිශ්‍ර අර්ථ ක්‍රමය

07 (i) මතවාදී ගැටුම් / යුදමය ගැටුම්

(ii) * වාර්ගිකත්වය
* දේශපාලනය
* ආගමික මතවාද
* සමාජ ආර්ථික තත්ත්වය

(iii) * ජීවිත හානි වැළකීම.
* දේපළ හානි වැළකීම.
* මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා වීම.
* ආර්ථික ස්ථාවරත්වය
* රට සමෘද්ධිමත් වීම.